# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2295/05 - 2022 අගෝස්තු මස 30 වැනි අඟහරුවාදා - 2022.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක : 86

එල්. ඩී. බී. 4/2011

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ වූ විශේෂ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති, ශාන්ත නිරිඇල්ල වන මා විසින්, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා -

(අ) මෙහි පළමුවන උපලේඛනයේ 2 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සෑදීමෙහි, අලෙවි කිරීමෙහි, ගබඩා කිරීමෙහි, විකිණීමෙහි සහ රැස්කිරීමෙහි නියැලී සිටින එම උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් පන්තියකට අයත් සාදන්නන් විසින් එම උපලේඛනයේ 3 වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව එම භාණ්ඩ සෑදීම, අලෙවි කිරීම, ගබඩා කිරීම, විකිණීම සහ රැස් කිරීම කරනු ලැබිය යුතු බවට ද;

(ආ) මෙහි දෙවන උපලේඛනයේ 2 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කිරීමෙහි, අලෙවි කිරීමෙහි, ගබඩා කිරීමෙහි, විකිණීමෙහි සහ රැස්කිරීමෙහි නියැලී සිටින එම උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් පන්තියකට අයත් වෙළඳුන් විසින් එම උපලේඛනයේ 3 වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව එම භාණ්ඩ ආනයනය කිරීම, අලෙවි කිරීම, ගබඩා කිරීම, විකිණීම සහ රැස් කිරීම කරනු ලැබිය යුතු බවට ද,

මෙයින් විධාන කරනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

| *I වන තීරය*<br>*සාදන්නන් පන්තිය* | *II වන තීරය*<br>*භාණ්ඩ* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| (1) යම් ද්‍රව්‍යයක් හෝ යම් භාණ්ඩයක් සාදන යම් තැනැත්තෙක්<br><br>(2) රසායනික ක්‍රියාවලියක් මගින් හෝ අන්‍යාකාරයකින් යම් ද්‍රව්‍යයක් හෝ යම් භාණ්ඩයක් එකලස් කරන හෝ සම්බන්ධ කරන යම් තැනැත්තෙක්<br><br>(3) යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් විකිණීම සඳහා සකස් කරන යම් තැනැත්තෙක් | (අ) සත්ත්ව ආහාර<br>(ආ) බෝතල් කළ පානීය ජලය<br>(ඇ) ටින් මාළු<br>(ඈ) සිමෙන්ති<br>(ඉ) පරිප්පු<br>(ඊ) ළදරු නැපි සහ සනීපාරක්ෂක තුවා<br>(උ) ආහාරයට ගන්නා පොල්තෙල්<br>(ඌ) ආහාරයට ගන්නා ලුණු<br>(එ) බිත්තර<br>(ඒ) පොහොර (කාබනික හෝ රසායනික)<br>(ඔ) කිරිපිටි, නැවුම් කිරි හෝ ළදරු කිරිපිටි<br>(ඕ) සහල්<br>(ක) වානේ සහ යකඩ දඬු<br>(ග) තිරිඟු පිටි | (අ) පාරිභෝගිකයෙකු හෝ යම් තැනැත්තෙකු විසින් ඉල්ලුම් කරන ලද භාණ්ඩ, සාධාරණ කාලසීමාවක් ඇතුළත නොපමාව සැපයිය යුතු ය.<br><br>(ආ) සාදන්නා සන්තකයේ හෝ පාලනයේ ප්‍රමාණවත් අමුද්‍රව්‍ය, ශ්‍රමය හෝ යන්ත්‍රෝපකරණ නොමැති නම් මිස හෝ වෙනත් යම් සාධකයක් සෑදීමේ ක්‍රියාවලියට බලනොපාන්නේ නම් සෑදීමේ උපරිම ධාරිතාවක් පවත්වා ගත යුතු ය.<br><br>(ඇ) පහත දක්වෙන තොරතුරු ඇතුළත් මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික කුවිතාන්සියක්/ බිලක් පාරිභෝගිකයෙකුට හෝ යම් තැනැත්තකුට නිකුත් කළ යුතු අතර, එම කුවිතාන්සියේ පිටපතක් තමා සතුව තබාගත යුතු ය :-<br><br>(i) කුවිතාන්සියේ / බිලේ අංකය;<br>(ii) ගණුදෙනුව සිල්ලර වෙළඳාමක් ද තොග වෙළඳාමක් ද යන්න;<br>(iii) විකිණීම කළ දිනය;<br>(iv) විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය;<br>(v) විකුණන ලද භාණ්ඩ පන්තිය;<br>(vi) විකුණන ලද භාණ්ඩ ඒකකයක වටිනාකම;<br>(vii) විකුණන ලද භාණ්ඩවල මුළු වටිනාකම;<br>(viii) කාණ්ඩ අංකය, ඇත්නම්; සහ<br>(ix) පාරිභෝගිකයාගේ හෝ යම් තැනැත්තෙකුගේ නම සහ ලිපිනය.<br><br>(ඈ) සෑදීමේ ක්‍රියාවලියට බාධා වන යම් කරුණක් උද්ගතව ඇති අවස්ථාවක, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ලිඛිත දැන්වීමේ උපදෙස් පිළිපැදිය යුතු ය.<br><br>(ඉ) උපරිම නිෂ්පාදන ධාරිතාව යටතේ වසරකට, කාර්තුවකට, කන්නයකට හෝ මාසයකට අවශ්‍ය සාමාන්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණයක් ඉක්ම වූ යම් අමුද්‍රව්‍ය ප්‍රමාණයක්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලිඛිත අනුමතයකින් තොරව යම් සාදන්නෙකු සන්තකයේ තබා නොගත යුතුය. එසේ යම් නිෂ්පාදකයෙකු සන්තකයේ අතිරික්ත අමුද්‍රව්‍ය ප්‍රමාණයක් තබා ගනු ලබන අවස්ථාවක, එම සාදන්නා විසින්, එම අතිරික්ත අමුද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධයෙන්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ලිඛිතව නිකුත් කරනු ලබන උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## දෙවන උපලේඛනය

| *I වන තීරය*<br>*වෙළෙඳුන් පන්තිය* | *II වන තීරය*<br>*භාණ්ඩ* | *III වන තීරය*<br>*කොන්දේසි* |
|---|---|---|
| (1) තොග වශයෙන් වෙනත් තැනැත්තන්ට භාණ්ඩ විකුණන හෝ සපයන යම් තැනැත්තෙක්.<br><br>(2) සිල්ලර මිලට පාරිභෝගිකයන්ට භාණ්ඩ විකුණන හෝ සපයන යම් තැනැත්තෙක්.<br><br>(3) විකිණීම හෝ සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කරන යම් තැනත්තෙක්.<br><br>(4) ප්‍රතිෂ්ඨාවක් සඳහා සේවා සපයන යම් තැනැත්තෙක්. | (අ) කෘෂි රසායනික ද්‍රව්‍ය<br>(ආ) මෝටර් රථ අමතර කොටස්<br>(ඇ) ලොකු ළූණු සහ රතු ළූණු<br>(ඈ) බෝතල් කල පානීය ජලය<br>(ඉ) ටින් මාළු<br>(ඊ) සිමෙන්ති<br>(උ) කඩල<br>(ඌ) කුකුල් මස්<br>(එ) කොත්තමල්ලි<br>(ඒ) පරිප්පු<br>(ඔ) ළදරු නැපි සහ සනීපාරක්ෂක තුවා<br>(ඕ) වියළි මිරිස්<br>(ක) කරවල<br>(ග) වියළි හාල්මැස්සන්<br>(ච) ආහාරයට ගන්නා තෙල්<br>(ජ) ආහාරයට ගන්නා ලුණු<br>(ට) බිත්තර<br>(ඩ) පොහොර (කාබනික හෝ රසායනික)<br>(ණ) සුදු ලූණු<br>(ත) මුං ඇට<br>(ද) එල් පී ගෑස්<br>(න) බඩ ඉරිඟු<br>(ප) වෛද්‍ය උපකරණ සහ උපාංග<br>(බ) කිරිපිටි/නැවුම් කිරි/ ළදරු කිරිපිටි<br>(ම) වී<br>(ය) අර්තාපල්<br>(අඅ) සහල්<br>(අආ) ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගන්නා වැලි, ගඩොල් සහ මැටල්<br>(අඇ) වානේ හා යකඩ දඬු<br>(අඈ) සීනි (රතු සහ සුදු)<br>(අඉ) ටයර් සහ ටියුබ්<br>(අඊ) කහ<br>(අඋ) තිරිඟු පිටි | (අ) පාරිභෝගිකයකු හෝ යම් තැනැත්තෙකු විසින් ඉල්ලුම් කරන ලද භාණ්ඩ, සාධාරණ කාලසීමාවක් ඇතුළත නොපමාව සැපයිය යුතු ය.<br><br>(ආ) පහත දැක්වෙන තොරතුරු ඇතුළත් මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික කුවිතාන්සියක්/ බිලක් පාරිභෝගිකයෙකුට හෝ යම් තැනැත්තකුට නිකුත් කළ යුතු අතර, එම කුවිතාන්සියේ පිටපතක් තමා සතුව තබාගත යුතු ය :-<br><br>(i) කුවිතාන්සියේ / බිලේ අංකය;<br>(ii) ගණුදෙනුව සිල්ලර වෙළදාමක් ද තොග වෙළදාමක් ද යන්න;<br>(iii) විකිණීම කළ දිනය;<br>(iv) විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය;<br>(v) විකුණන ලද භාණ්ඩ පන්තිය;<br>(vi) විකුණන ලද භාණ්ඩ ඒකකයක වටිනාකම;<br>(vii) විකුණන ලද භාණ්ඩවල මුළු වටිනාකම;<br>(viii) කාණ්ඩ අංකය, ඇත්නම්; සහ<br>(ix) යම් තැනැත්තෙකුගේ හෝ පාරිභෝගිකයාගේ නම සහ ලිපිනය<br><br>(ඇ) වෙනත් තැනැත්තන්ට භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීමට හෝ සැපයීමට, විකිණීම හෝ සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කිරීමට හෝ ප්‍රතිෂ්ඨාවක් සඳහා සේවා සැපයීමට බාධා වන යම් කරුණක් උද්ගතව ඇති අවස්ථාවක පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කරන ලද ලිඛිත දැන්වීමේ උපදෙස් පිළිපැදිය යුතු ය. |

**ශාන්ත නිරිඇල්ල,**
සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2022 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.